ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024.09.12

පැමිණිලි පාර්ශවය : ඩී.පී. නදී තනූජා ආනන්ද,
අංක 444/8 ඒ, විහාර මාවත,
කඩුවෙල.

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පතිනිය,
ගෝතමී බාලිකා විද්‍යාලය,
කොළඹ 10.

**පැමිණිලි අංකය : HRC/HO/4985/23**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

උක්ත පැමිණිලිකාරිය විසින් 2023.12.20 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉහත සඳහන් අංකය යටතේ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. එහිදී පැමිණිලිකාරිය ප්‍රකාශ කර සිටින්නේ පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනූජනා යන අය කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක වන බවත්, කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ 2019/2022 වර්ෂ සඳහා වූ වර්ණ රාත්‍රිය 2023.12.12 වන දින පැවැත්වුණු බවත්, එහිදී තම දියණියට "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සම්මානය ලැබීමට අවශ්‍ය සියලු සුදුසුකම් පැවතිය ද ඇයට එම සම්මානය නොලැබුණු බවත් ය. එසේම, මුල සිටම විද්‍යාලයට එම සම්මානය පිරිනැමීමට අවශ්‍යව තිබූ ශිෂ්‍යාව හට එය ලබාදීමට කටයුතු කර ඇති බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

තවද, "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තෝරා පත් කර ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී තම දියණියගේ ජයග්‍රහණයන් සහ එකී ජයග්‍රහණයන්ට අදාළ සහතිකපත් නිසි පරිදි සළකා බලා ලකුණු ලබාදීමක් සිදු කර නොමැති බව ද පැමිණිලිකාරිය විසින් දක්වා ඇත. මේ හේතුවෙන් තම දියණියගේ අයිතිවාසිකම් කඩවීමක් සිදුව ඇති බවට පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එසේම, මේ ආකාරයට එකී සම්මානය යුක්ති සහගත නොවන අයුරින් අහිමි කිරීම හේතුවෙන් තම දියණිය මානසික පීඩනයකට ලක්ව ඇති බවත්, මේ වනවිට පාසල් යාම ප්‍රතික්ෂේප කරන බැවින් ඇයව වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කර ඇති බවත් පැමිණිලිකාරිය විසින් තවදුරටත් සඳහන් කර ඇත. එසේ හෙයින් කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ වර්ණ රාත්‍රියේ දී "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සම්මානය ලබාදීමේදී විද්‍යාලය විසින් අදාළ කරගනු ලැබූ නිර්ණායකයන් සහ තම දියණිය



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

හට ලබාදී ඇති ලකුණු ප්‍රමාණයන් නැවත සළකා බලන ලෙස පැමිණිලිකාරිය විසින් මෙම පැමිණිල්ල තුළින් ඉල්ලා සිටිනු ලබයි.

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණය 2024.03.19 වන දින පැමිණිලිකාර පාර්ශවයේ සහ වගඋත්තරකාර පාර්ශවයේ සහභාගීත්වයෙන් කොමිෂන් සභාව හමුවේ පවත්වන ලදී.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

2024.03.19 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කරමින් සහභාගී වූ කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ ගුරුභවතුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ විද්‍යාලයේ 2019/2022 වර්ෂයන්ට අදාළව 2023.12.12 වන දින පැවති වර්ණ රාත්‍රියේදී “සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව” තෝරා පත් කිරීමේදී ඊට අදාළ නිර්ණායකයන්ට අනුව නිසි පරිදි ලකුණු ලබාදී එම සම්මානය ලැබීමට වඩාත් සුදුසු ශිෂ්‍යාව තෝරා පත් කර ගැනීම සිදු කළ බවයි.

වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටින්නේ “සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව” තේරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ක්‍රීඩිකාවන් තිදෙනෙකු ඉදිරිපත් වූ බවත්, එම තිදෙනා විසින් පහත පරිදි ලකුණු ලබා ගෙන ඇති බවත් ය.

1. කේ.ජී.එස්. සෙනේෂා - ලකුණු 24
2. ඩී.එම්. සිනලි තනුජනා - ලකුණු 75
3. ඩබ්.ඩී.ඒ. විතාරණ - ලකුණු 76

ඒ අනුව වැඩිම ලකුණු ප්‍රමාණය වන ලකුණු 76ක් ලබාගත් ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාව සඳහා “සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව” සම්මානය 2023.12.12 වන දින කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ පැවති වර්ණ රාත්‍රියේදී පිරිනැමූ බව වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද “සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව” තෝරා පත් කර ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී ඒ සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍යාවන් ලබාගත් ලකුණු සහ ඉදිරිපත් කර ඇති ලේඛන නැවත නව කමිටුවක් මගින් පරීක්ෂා කොට කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර පාර්ශවය එකඟ වූ අතර, 2024.05.30 දිනැතිව එකී වාර්තාව ඉදිරිපත් කර ඇත.

ඉහත කී 2024.05.30 දිනැති වාර්තාව ප්‍රකාරව ටී.එම්. මුණසිංහ මිය (සහකාර විදුහල්පති), එච්. ඉන්ද්‍රා දමයන්ති මිය (සහකාර විදුහල්පති - විෂය සමගාමී) සහ ඒ.එම්.එන්.එල්.පී. ද සිල්වා මයා (කළමනාකරණ කමිටු සාමාජික/ජ්‍යෙෂ්ඨ ගුරු) යන තිදෙනාගෙන් සමන්විත පාසල් විමර්ශන කමිටුව මගින් 2023.12.12 වන දින කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ පැවති වර්ණ රාත්‍රියේදී “සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව” තේරීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ දී කිසියම් අක්‍රමිකතාවයක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කරනු ලැබූ බව සඳහන් කර ඇත.

ඒ අනුව ඉහත කී කමිටු වාර්තාව ප්‍රකාරව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව විසින් 2023.12.04 වන දින "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තේරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වී ඇති නමුත්, එකී ශිෂ්‍යාව විසින් ඇය සහභාගී වී ඇති "Asian Youth Rapid Chess Championship" සහ "16th Asian Schools Rapid Chess Championship 2022" යන ජාත්‍යන්තර තරඟ සහභාගීත්වයන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සහිත ලිපිලේඛන කිසිවක් ඉදිරිපත් කර නොමැති බැවින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඒ සඳහා ඇයට කාලයක් ලබාදෙමින් පරීක්ෂණ කටයුතු ඉදිරි දිනයකට කල් දමා ඇති බව සඳහන් කර ඇත.

ඉන් අනතුරුව 2023.12.11 වන දින නැවත ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇති අතර, එදින ද ඇය අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම ශිෂ්‍යාව ගැන සානුකම්පිතව සළකා බලා එම ලේඛන ඉදිරියේදී ලබාදීමේ පොරොන්දුව මත සම්මුඛ පරීක්ෂණය පවත්වා ලකුණු සටහන් පත්‍රයේ සටහනක් ද තබා ජාත්‍යන්තර තරඟ දෙක සඳහා ලකුණු 07ක් බැගින් ලකුණු 14ක් ලබාදී ඇති බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් 2024.05.30 දිනැති වාර්තාව මගින් දක්වා ඇත.

එසේ වුවද, පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව විසින් ඉහත කී ජාත්‍යන්තර සහභාගීත්වය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සහිත ලිපිලේඛන ඉදිරිපත් කර නොමැති බැවින් එම ලකුණු 14 ඇයට හිමි නොවන බවත්, ඒ අනුව ඇයට හිමි විය යුත්තේ මුළු ලකුණු 75ක් නොව ලකුණු 61ක් බවත් නැවත පරික්ෂා කර බැලීම් සිදු කරන ලද පාසල් විමර්ශන කමිටුව විසින් සිය 2024.05.30 දිනැති වාර්තාව ප්‍රකාරව සඳහන් කර ඇත.

තවද, ඉහත කී කමිටුව විසින් 2024.05.30 දිනැති වාර්තාව ප්‍රකාරව දක්වා ඇත්තේ එකී කමිටුව විසින් පරිශීලනය කරන ලද ලිපිගොනු වලට ඇතුළත්ව තිබූ තොරතුරු අනුව 2023.12.12 වන දින කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේදී පවත්වන ලද වර්ණ රාත්‍රියේ "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" ලෙස තේරී පත්වී ඇති ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාවට ලැබී ඇති ලකුණු 76 නිවැරදි බවත්, ඩී.එම්. සිනලි තනුජනා (පැමිණිලිකාරිගේ දියණිය) ශිෂ්‍යාවට ලකුණු 61ක් පමණක් හිමිවන බවත්, ඒ අනුව "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" ලෙස ලකුණු 76ක් ලබාගත් ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාව තෝරා පත් කර ගැනීම නිවැරදි තීරණයක් බවත් ය.

**<u>නිරීක්ෂණ</u>**

පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන අය කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක වන බවත්, කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ 2019/2022 වර්ෂ සඳහා වූ වර්ණ රාත්‍රිය 2023.12.12 වන දින පවත්වා ඇති බවත්, එකී වර්ණ රාත්‍රියේදී "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සඳහා පිරිනැමෙන සම්මානය සඳහා ශිෂ්‍යාවක තෝරා පත් කරගැනීමේ සම්මුඛ පරීක්ෂණය

සඳහා පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන අය 2023.12.04 වන දින සහභාගී වී ඇති බවත් පැමිණිලිකාර පාර්ශවයේ සහ වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම් අනුව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ වර්ණ රාත්‍රියේදී පිරිනමන "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සම්මානය සඳහා සුදුසු ශිෂ්‍යාවක තෝරා පත් කර ගැනීමට අදාළව සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබුව ද, ඒ සඳහා අයදුම් කිරීමට නිසි පරිදි සකස් කරන ලද අයදුම්පත්‍රයක් විද්‍යාලය විසින් ඉදිරිපත් කර නොමැති බව 2024.03.19 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් පිළිගෙන ඇත. එසේ වුවද "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තේරීමට අදාළව නිසි පරිදි සකස් කරන ලද නිර්ණායකයන් සහ ලකුණු ලබාදීමේ පටිපාටියක් වගඋත්තරකාර පාර්ශවය විසින් ලකුණු ලබාදීමේදී අදාළ කරගෙන ඇති බව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය වේ.

එසේම, ඉහත කී "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තේරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ශිෂ්‍යාවන් තිදෙනෙකු ඉදිරිපත්ව ඇති බවත්, එම තිදෙනා අතරින් කේ.ජී.එස්. සෙනේෂා යන අය ලකුණු 24ක් ද, ඩී.එම්. සිනලි තනුජනා යන අය ලකුණු 75ක් ද, ඩබ්.ඩී.ඒ. විතාරණ යන අය ලකුණු 76ක් ද ලබාගෙන ඇති බවත්, ඒ අනුව එම ශිෂ්‍යාවන් අතරින් වැඩිම ලකුණු ප්‍රමාණය වන ලකුණු 76ක් ලබා ගත් ඩබ්.ඩී. ඒ. විතාරණ යන ශිෂ්‍යාව හට "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සඳහා වන සම්මානය ලබා දී ඇති බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව හට හිමිවී ඇත්තේ ලකුණු 75ක් වන බවත්, ඇය සහ සම්මානය ලැබූ ශිෂ්‍යාව හිමි කරගෙන ඇති ලකුණු ප්‍රමාණයන් අතර වෙනස එක් ලකුණක් පමණක් වන බවත් පෙනී යයි.

"සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සඳහා වන සම්මානය හිමි කරගත් ඩබ්.ඩී.ඒ. විතාරණ යන ශිෂ්‍යාව ලබාගෙන ඇති ලකුණු පිළිබඳව සළකා බැලීමේදී, වගඋත්තරකාර පාර්ශවය විසින් "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තේරීමට අදාළ කරගෙන ඇති නිර්ණායක අතරින් පළමු නිර්ණායකය වන අදාළ ශිෂ්‍යාව වයස අවුරුදු 16ට වැඩි සහ 21ට අඩු විය යුතුය යන්න ඇය විසින් සපුරා ඇත. මන්දයත්, ඒ අවස්ථාව වනවිට ඇයගේ වයස අවුරුදු 17ක් බව නිරීක්ෂණය වන බැවිනි. එසේම, දෙවන නිර්ණායකය යටතේ කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ ඉගෙන ගනු ලබූ කාලසීමාව සඳහා 6 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා එක් වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05ක් හිමි වන අතර, ඉහත කී ඩබ්.ඩී.ඒ. විතාරණ යන ශිෂ්‍යාව 9 වන ශ්‍රේණියේ සිට 12 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන බැවින් ඒ සඳහා ලකුණු 03ක් ලබාදී ඇත.

තුන්වන නිර්ණායකය යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල සඳහා ලකුණු ලබාදී ඇති අතර, ඒ යටතේ ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාව විසින් 2021 වර්ෂයේදී සාමාන්‍ය පෙළ විභාගය

සඳහා ලබාගත් "A" සාමාර්ථ දෙක සඳහා ලකුණු 03 බැගින් ලකුණු 06ක් ද, "B" සාමාර්ථ දෙක සඳහා ලකුණු 02 බැගින් ලකුණු 04ක් ද, "C" සාමාර්ථ පහ සඳහා ලකුණු 01 බැගින් ලකුණු 05ක් ද වශයෙන් ලකුණු 15ක් ලබාදී ඇත.

හතරවන නිර්ණායකය යටතේ ඉල්ලුම් කරන වර්ෂයකට ආසන්න වසර 03ක් තුළ විද්‍යාලයේ ක්‍රීඩා කණ්ඩායමේ අඛණ්ඩව සාමාජිකත්වය ලබා තිබීම සඳහා ලකුණු ලබාදී ඇති අතර, ඒ අනුව ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාව හට 2019, 2021 සහ 2022 වසර වල සාමාජිකත්වය දැරීම වෙනුවෙන් ලකුණු 03ක් ලැබී ඇත.

පස්වන නිර්ණායකය යටතේ ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාවගේ ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලකුණු ලබාදී ඇති අතර, එහිදී 2019 වර්ෂයේදී 6th International Open Karate Championship "KL Mayor's Cup" ජාත්‍යන්තර තරඟාවලියේ වයස අවුරුදු 15න් පහළ "Female Cadet Team Kumite" හි ප්‍රථම ස්ථානය හිමි කර ගැනීම වෙනුවෙන් ලකුණු 20ක් ද, "Girls Team Kata"හි ප්‍රථම ස්ථානය හිමි කර ගැනීම වෙනුවෙන් ලකුණු 20ක් ද, "Female Individual Cadet 54 KG"හි තෙවන ස්ථානය හිමි කර ගැනීම වෙනුවෙන් ලකුණු 10ක් ද ලබාදී ඇත. එසේම, 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා පාසල් ජ්‍යෙෂ්ඨ කරාතේ ශූරතාවයෙහි වයස අවුරුදු 18න් පහළ "Girls Kata-Black Belt" ඉසව්වෙහි තෙවන ස්ථානය ලබා ගැනීම වෙනුවෙන් ලකුණු 02ක් ද ලබාදී ඇත.

හයවන නිර්ණායකය යටතේ ක්‍රීඩා කණ්ඩායම් නායකත්වය දැරීම වෙනුවෙන් ලකුණු ලබාදී ඇති අතර, ඒ යටතේ ඩබ්.ඩී.ඒ. විතාරණ ශිෂ්‍යාව විසින් 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා පාසල් ජ්‍යෙෂ්ඨ කරාතේ ශූරතාවයේ දී විද්‍යාලයේ කරාතේ කණ්ඩායමේ නායකත්වය දැරීම වෙනුවෙන් ලකුණු 03ක් ලබාදී ඇත.

ඉහත දක්වන ලද ආකාරයට දෙවන නිර්ණායකය යටතේ ලකුණු 03ක් ද, තුන්වන නිර්ණායකය යටතේ ලකුණු 15ක් ද, හතරවන නිර්ණායකය යටතේ ලකුණු 03ක් ද, පස්වන නිර්ණායකය යටතේ ලකුනු 52ක් ද, හයවන නිර්ණායකය යටතේ ලකුණු 03ක් ද වශයෙන් මුළු ලකුණු 76ක් ඩබ්.ඩී.ඒ. විතාරණ යන ශිෂ්‍යාව වෙත ලැබී ඇති බවත්, ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව නිසි පරිදි එම ලකුණු ප්‍රමාණය එම ශිෂ්‍යාව වෙත ලබාදී ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" සඳහා අයදුම් කිරීමේදී වයස අවුරුදු 17ක්ව තිබී ඇති බැවින් පළමුවන නිර්ණායකය යටතේ වයස අවුරුදු 16ට වැඩි සහ 21ට අඩු විය යුතුය යන්න ඇය විසින් සපුරා ඇති බව පෙනී යයි. එසේම, දෙවන නිර්ණායකය යටතේ ගෝතමී බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලැබූ කාලසීමාව සඳහා ලකුණු ලබාදී ඇති අතර, පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව 6 ශ්‍රේණියේ සිට 12 වන

ශ්‍රේණිය දක්වා කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීම වෙනුවෙන් ලකුණු 05ක් ලැබී ඇත.

තුන්වන නිර්ණායකය යටතේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල සඳහා ලකුණු ලබාදී ඇති අතර, එහිදී පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව විසින් 2021 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ලබා ඇති "A" සාමාර්ථ 08 සඳහා ලකුණු 03 බැගින් ලකුණු 24ක් ද, "B" සාමාර්ථය සඳහා ලකුණු 02ක් ද වශයෙන් ලකුණු 26 ක් ලැබී ඇත.

හතරවන නිර්ණායකය යටතේ ඉල්ලුම් කරන වර්ෂයකට ආසන්න වසර 03ක් තුළ විද්‍යාලයේ ක්‍රීඩා කණ්ඩායමේ අඛණ්ඩව සාමාජිකත්වය ලබා තිබීම සඳහා ලකුණු ලබාදී ඇති අතර, ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව හට 2020, 2021 සහ 2022 වසර වල සාමාජිකත්වය දැරීම වෙනුවෙන් ලකුණු 03ක් ලැබී ඇත.

පස්වන නිර්ණායකය යටතේ පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව හට ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලකුණු ලබාදී ඇත. ඒ යටතේ 2019 වර්ෂයේදී වයස අවුරුදු 14න් පහළ "Asian Youth Rapid Chess Championship" යන අන්තර්ජාතික තරඟය සඳහා සහභාගී වීම වෙනුවෙන් ලකුණු 07ක් ද, 2022 වර්ෂයේදී වයස අවුරුදු 17න් පහළ "16th Asian Schools Rapid Chess Championships - 2022" නම් ජාත්‍යන්තර තරඟ ඉසව්ව සඳහා සහභාගී වීම වෙනුවෙන් ලකුණු 07 ක් ද ලැබී ඇත. එහෙත්, ලකුණු ලබාදීමේ පටිපාටිය අනුව ජාත්‍යන්තර කණිෂ්ඨ ශූරතාවලි ජයග්‍රහණ සහ සහභාගීත්වය සඳහා ලකුණු ලබාදෙනු ලබන්නේ එකී තරඟ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ඒවා සඳහා සහභාගී වී ඇත්නම් පමණි. එසේ හෙයින් පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව සහභාගී වූ ඉහත කී තරඟ සඳහා ඇය වෙත ලකුණු පිරිනැමීමේදී එලෙස ලකුණු ලබාදීම සිදු කරනු ලබන්නේ එම තරඟ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සහිත බවට ලේඛන ඉදිරිපත් කිරීමේ පොරොන්දුව මත බවට සටහනක් යොදා ඇති බව පෙනී යයි. එසේ වුවද පැමිණිලිකාර පාර්ශවය ප්‍රකාශ කර සිටින්නේ එවැනි පොරොන්දුවක් ලබාදී නොමැති බවයි.

එසේම, වගඋත්තරකාර කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලය විසින් කොමිෂන් සභාවේ දැනුම්දීම මත "සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තෝරා පත් කර ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයේදී අක්‍රමිකතාවයක් සිදුව තිබේදැයි පරීක්ෂා කිරීමට පත් කළ කමිටුව විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති 2024.05.30 දිනැති වාර්තාව ප්‍රකාරව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව විසින් "Asian Youth Rapid Chess Championship" සහ "16th Asian School Rapid Chess Championship - 2022" යන ජාත්‍යන්තර තරඟ සහභාගීත්වයන් සම්බන්ධයෙන්

අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය සහිත බවට ලිපිලේඛන ඉදිරිපත් කර නොමැති බැවින් ඒ සඳහා මුල් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ලබාදී තිබූ ලකුණු 14ක ප්‍රමාණය ද එකී ශිෂ්‍යාවට හිමි නොවන බව දක්වා ඇත.

කෙසේ වෙතත් ඉහත කී ජාත්‍යන්තර තරඟාවලි දෙක අතුරින් "16th Asian Schools Chess Championships - 2022" සඳහා වයස අවුරුදු 17න් පහළ බාලිකා තරඟ ඉසව්වෙන් ගෝතමී බාලිකා විද්‍යාලයේ ඩී.එම්. සිනලි තනුජනා (පැමිණිලිකාරියගේ දියණිය) යන ක්‍රීඩිකාව ශ්‍රී ලංකා පාසල් චෙස් කණ්ඩායම නියෝජනය කිරීම සඳහා තෝරා ගෙන ඇති බවත්, එම තරඟාවලිය පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/9/15/6/1/39 සහ 2022.11.30 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් අනුමැතිය ලබාදී ඇති බවත් ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය විසින් වගඋත්තරකාර කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලය වෙත දැනුම් දී ඇති බව නිරීක්ෂණය වේ. එවැනි පසුබිමක් තුළ එම තරඟාවලිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති බවට ලේඛන ඉදිරිපත් කරන ලෙසට පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව හට වගඋත්තරකාර කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලය විසින් දැනුම්දීම යුක්තිසහගත නොවන බව පෙනී යයි. එසේම, එකී ශිෂ්‍යාව හට එම තරඟ ඉසව්ව සඳහා ලකුණු හිමිවිය යුතු බවත් නිරීක්ෂණය වේ.

එසේම, වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති නිර්ණායක ප්‍රකාරව වයස අවුරුදු 13ට වැඩි අවුරුදු 21ට අඩු උපරිම වයස් කාණ්ඩ 03ක් සඳහා එක් වයස් කාණ්ඩයක් යටතේ ක්‍රීඩා තරඟ 03ක් හෝ ඉසව් 03ක් හෝ ක්‍රීඩා තරඟ හා ඉසව් 03ක් සඳහා ඉහළම සහතික සඳහා ලකුණු හිමි වන බව දක්වා ඇත.

එහෙත් පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව හට වයස අවුරුදු 17න් පහළ වයස් කාණ්ඩය යටතේ ලකුණු ලබාදී ඇත්තේ ඇය සහභාගී වූ "16th Asian Schools Chess Championships - 2022" හි Rapid ඉසව්ව සඳහා පමණක් බව නිරීක්ෂණය වේ. නිර්ණායක ප්‍රකාරව එක් වයස් කාණ්ඩයක් යටතේ ඉසව් 03කට ලකුණු හිමි වන බැවින් පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව "16th Asian Schools Chess Championships - 2022" හි සහභාගී වූ Blitz සහ Classic යන ඉසව් දෙක සඳහා ද ලකුණු ලැබිය යුතුව ඇති බව කොමිෂන් සභාවට පෙනී යයි. ඒ අනුව "16th Asian Schools Chess Championships - 2022" ජාත්‍යන්තර තරඟාවලියක් වන බැවින් වයස අවුරුදු 17න් පහළ වයස් කාණ්ඩය යටතේ Rapid, Blitz සහ Classic යන ඉසව් තුන සඳහා සහභාගීත්වය වෙනුවෙන් එක් තරඟ ඉසව්වක් සඳහා ලකුණු 07 බැගින් ලකුණු 21ක් ලැබිය යුතු බව නිරීක්ෂණය වේ.

තවද, වගඋත්තරකාර ගෝතමී බාලිකා විද්‍යාලය විසින් පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා ශිෂ්‍යාව හට වයස අවුරුදු 14න් පහළ වයස් කාණ්ඩය යටතේ "National Youth Blitz

Chess Championship" හි ශූරතාවය සඳහා ලකුණු 05ක් ද, "National Youth Rapid Chess Championship" හි ශූරතාවය සඳහා ලකුණු 05ක් ද බැගින් ලකුණු 10ක් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, වයස අවුරුදු 18න් පහළ වයස් කාණ්ඩය යටතේ "Sri Lanka National Youth Rapid Chess Championship – 2022" හි දෙවන ස්ථානය සඳහා ලකුණු 03ක් සහ "Sri Lanka National Youth Blitz Chess Championship – 2022" හි තෙවන ස්ථානය සඳහා ලකුණු 02ක් වශයෙන් ලකුණු 05ක් ලබාදී ඇති බවද නිරීක්ෂණය වේ. ඉහත කී තරඟ ඉසව් 04 අන්තර් පාසල් තරඟ ලෙස සළකා අදාළ ලකුණු ලබාදීම සිදු කර ඇති බව පෙනී යයි.

එහෙත් පැමිණිලිකාර පාර්ශවය විසින් දක්වා ඇත්තේ එකී තරඟ අන්තර් පාසල් තරඟ නොව ජාතික මට්ටමේ තරඟ වන බවයි. ඒ අනුව එම ජයග්‍රහණයන්ට අදාළ සහතිකපත්‍ර සම්බන්ධයෙන් 2024.09.06 වන දින කොමිෂන් සභාව විසින් චෙස් සංගමය වෙතින් සිදු කළ විමසීමේදී ද එකී තරඟ සියල්ල ජාතික මට්ටමේ තරඟ බවට සනාථ කරන ලදී. එසේ හෙයින් පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව විසින් ලබාගෙන ඇති ඉහත කී "National Youth Blitz Chess Championship" සහ "National Youth Rapid Chess Championship" හි ශූරතාවයන් වෙනුවෙන් එක් ජයග්‍රහණයක් සඳහා ලකුණු 05 බැගින් ලකුණු 10ක් නොව ලකුණු 07 බැගින් ලකුණු 14ක් ද, "Sri Lanka National Youth Rapid Chess Championship - 2022" හි දෙවන ස්ථානය සඳහා ලකුණු 03ක් නොව ලකුණු 05ක් ද, "Sri Lanka National Youth Blitz Chess Championship - 2022" හි තෙවන ස්ථානය සඳහා ලකුණු 02ක් නොවන ලකුණු 03ක් ද ලකුණු ලබාදීමේ පටිපාටිය ප්‍රකාරව හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

මීට අමතරව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව හට වයස අවුරුදු 18 න් පහළ වයස් කාණ්ඩය යටතේ "Sri Lanka Women's National Rapid Chess Championship – 2022" යන ජාතික මට්ටමේ තරඟ සහභාගීත්වය වෙනුවෙන් ලකුණු 03ක් ද ලැබී ඇත.

ඒ අනුව පස්වන නිර්ණායකය යටතේ ක්‍රීඩා ජයග්‍රහණ වෙනුවෙන් පැමිණිලිකාරියගේ දියණිය වන ඩී. එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව හට වයස අවුරුදු 14න් පහළ වයස් කාණ්ඩය සඳහා ලකුණු 14ක් ද, වයස අවුරුදු 17න් පහළ වයස් කාණ්ඩය සඳහා ලකුණු 21ක් ද, වයස අවුරුදු 18න් පහළ වයස් කාණ්ඩය සඳහා ලකුණු 11ක් ද වශයෙන් ලකුණු 46ක් හිමි විය යුතු බව කොමිෂන් සභාවට පෙනී යයි.

තවද, හයවන නිර්ණායකය යටතේ සමස්ත ලංකා චෙස් කණ්ඩායමක නායකත්වය දැරීම වෙනුවෙන් ලකුණු 03ක් ද, හත්වන නිර්ණායකය යටතේ 2016, 2017 සහ 2018 වර්ෂයන්ට අදාළව පාසල් වර්ණ

සහතික සඳහා එක් වර්ෂයකට ලකුණු 02 බැගින් ලකුණු 06ක් ද පැමිණිලිකාරියගේ දියණිය වන ඩී. එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව හට ලැබී ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත දක්වන ලද කරුණු අනුව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්. සිනලි තනුජනා යන ශිෂ්‍යාව හට "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව"තේරීමේ සම්මුඛ පරීක්ෂණයේදී වගඋත්තරකාර කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලය විසින් ලබාදී ඇති ලකුණු ප්‍රමාණයන් අතරින් ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලබා දෙන ලද ලකුණු ප්‍රමාණය ලකුණු 32 නොව ලකුණු 46ක් විය යුතු බවත්, ඒ අනුව ඇයගේ මුළු ලකුණු සංඛ්‍යාව ලකුණු 75 ක් නොව ලකුණු 89 ක් විය යුතු බවත් කොමිෂන් සභාවට නිරික්ෂණය වේ.

මේ අනුව සලකා බැලීමේ දී ලකුණු 76 ක් ලබා ගනිමින් "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" ලෙස තේරි පත්වූ ඩබ්.ඩී.ඒ. විතාරණ යන ශිෂ්‍යාවට වඩා පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්.සිනලි තනුජනා යන ශිෂ්‍යාව ලකුණු ලබාගෙන ඇති බව කොමිෂන් සභාවට පෙනී යයි. එසේම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මෙන්ම වගඋත්තරකාර කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලය විසින් නැවත අදාළ ලකුණු පරීක්ෂා කිරිම සඳහා පත් කරන ලද පාසල් විමර්ශන කමිටුව ද පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්.සිනලි තනුජනා යන ශිෂ්‍යයාවගේ සහතික පත්‍ර නිසි පරිදි සලකා බලා ලකුණු ලබා දී නොමැති බව නිරික්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්.සිනලි තනුජනා යන ශිෂ්‍යාව විසින් කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ 2019/2022 වර්ෂයන් සඳහා වන වර්ණ රාත්‍රියට අදාළව "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව " තේරිම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ දි සිය ජයග්‍රහණයන්ට අදාලව සහතික පත්‍ර නිසි පරිදි ඉදිරිපත් කර තිබුණ ද, වගඋත්තරකාර පාර්ශවය විසින් එකී සහතික පත්‍ර සඳහා නිසි පරිදි ලකුණු ලබා දි නොමැති බව තහවුරු වේ. ඒ අනුව පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්.සිනලි තනුජනා ශිෂ්‍යාව හට සැබැවින්ම ලැබිය යුතුව තිබූ ලකුණු 89 වෙනුවට ලකුණු 75ක් පමණක් ලබා දීම තුළින් ඇය හට "සෑම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව " ලෙස තේරී පත්වීමට තිබූ අවස්ථාව අහිමිකර ඇතිබව දැකගත හැකිය.

එසේ හෙයින් වගඋත්තරකාර පාර්ශවය විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරිම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුතු ය, යන පැමිණිලිකාර පාර්ශවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

1. වගඋත්තරකාර පාර්ශවය විසින් කොළඹ ගෝතමී බාලිකා විද්‍යාලයේ 2024 වර්ෂයේ දී පවත්වන වර්ණ රාත්‍රියේ දී පැමිණිලිකාරියගේ දියණිය වන ඩී.එම්.සිනලි තනුජනා යන ශිෂ්‍යාව හට "සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව " ලෙස සම්මානයක් ලබා දීමට කටයුතු කළ යුතුය.

2. වගඋත්තරකාර පාර්ශවය විසින් "සැම අතින්ම දක්ෂතම ක්‍රීඩිකාව" තේරීමේදි ඒ සඳහා අයදුම් කිරීමට විද්‍යාලය විසින් අදාළ කරගනු ලබන නිර්ණායකයන්ට අනුරූපීව නිසි පරිදි සකස් කරන ලද අයදුම්පත්‍රයක් විද්‍යාලයේ ශිෂ්‍යාවන් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

3. විද්‍යාලයේ ශිෂ්‍යාවන්හට බලපාන්නා වූ මෙවැනි විශේෂ ක්‍රියාකාරකම් වලදී වඩා වගකීමකින් හා සැලකිලිමත්භාවයකින් කටයුතු කිරීමටත්, මෙවැනි තත්ත්වයන් තවදුරටත් ඇති වීම වැළැක්වීමට පියවර ගැනීමටත් වගඋත්තරකාර පාර්ශවය විසින් වගබලා ගත යුතු ය.

2024. 10 . 16 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරුවන් විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් : 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. } දැනගැනීම සඳහා

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. } දැනගැනීම සඳහා